

# කතෘගෙන්

තේ, රබර් හා පොල් වැනි වෙළෙඳ බෝග වගාව පිළිබඳ නිපුනත්වයක් ලාංකික සින්ට ලැබී අවුරුදු සියයක් පමණ ගතවී ඇති නමුත් මෙරට ආහාර බෝග වගාවේදී හා සතුන් ඇති කිරීමේදී ගොවීන් දක්වන උනන්දුව සහ අනුගමනය කරන ගොවිතැන් ක්‍රම සතුටුදායක යැයි කිව නොහැක. පැරණි ක්‍රම පමණක් අනුගමනය කර ලාංකික කෘෂිකර්මාන්තයේ ශීඝ්‍ර දියුණුවක් ඇතිකරලීමට පිළිවන් නොවන බව අවිවාදයෙන් පිළිගත යුත්තකි. වඩා හොඳ ප්‍රතිඵල ලබාගත හැකිවන පරිදි රටේ දැනට භාවිතය වන ගොවිතැන් ක්‍රම හැඩගස්සා ගැනීමට ලක් ගොවියාට, විදේශීය රටවල ගොවීන්ගෙන් උගත හැකි දේ එමටය. අපේ ගොවිතැන දියුණුකර, කෘෂිකර්මාන්තය ඵලදායක වෘත්තියක් ලෙස පරිවර්තනය කිරීමට නම්, ගොවිකර්මාන්තය දියුණුවූ විදේශීය රටවල ගොවීන් දක්වන උනන්දුවට සරිලන උනන්දුවකින් ක්‍රියා කළ යුතුමය. බෝග වගාවෙන් සහ සත්ව පාලනයෙන් සතුටුදායක ආදායමක් ලබාගත හැකිවන්නේ නිෂ්පාදනය වර්ධනය කිරීමෙනි. විදේශීය රටවල කෘෂිකර්මය මැයින් ලිපි මාලාවක් මෙම සඟරාවේ පළකිරීමට අදහස් කරන ලද්දේ අපේ ගොවි මහතුන්ට එය ප්‍රයෝජනවත් වේයැයි විශ්වාස කරන හෙයින්ය.

ලංකාව හා ඕලන්ද දේශය අතර වටිනා සමානකම් කීපයක් තිබේ. ලංකාවටද වඩා ඕලන්තය ජනගහනයෙන් අධික රටකි. ඕලන්තය දිවයිනක් නොවූ මුත් අර්ධද්වීපයක් වශයෙන් මූදු බඩ රටකි. ඒ අතර එහි ඇති ඇල දොළ, ගංගා, වැව්, පොකුණු රාශිය නිසා එය ජලාශ්‍රිත රාජ්‍යයකි. මෙම කුඩා ද්වීපය අසලින් ඉන්දියාව වැනි විශාල රාජ්‍යයක් පිහිටා ඇති අයුරු ඕලන්තයට යාබදව හා කිට්ටුව විශාල රාජධානි කීපයක්ම වෙති. ලංකාවේ පිහිටීම හේතු කොට ගෙන මෙහි ගොවිතැනේ සමහර අංශ පමණක් දියුණුවිය. ඕලන්ත රටේ පිහිටීමේ හේතුවෙන් එහි කෘෂිකර්මයද එලෙස එක් ස්වරූපයකට හැඩ ගැස්සී තිබේ. මෙවැනි සමානකම් මේ දෙරට ඇති අතර විශේෂ වෙනස්කම් පවා කීපයක්ම තිබේ. ඒවායින් එකක් නම්, ලංකාව ආහාර බෝග වගාව හා සත්ව පාලනය පිළිබඳ දුර්වල අතර ඕලන්තය මෙම දෙකොටසින් ඉතා විශිෂ්ඨ

ස්ථානයක් රැගෙන ඇත. අපේ මේ දිවයිනෙහි මෙම අංශ දෙක දියුණු කර ගැනීමට අපට බෙහෙවින් වුවමනා වී තිබේ. ඒ පිළිබඳව වටිනා අධ්‍යාපනයක් ඕලන්ද ගොවියා ගෙන් අපට ලබා ගත හැකිව තිබීම වැදගත් දෙයකි.

ඕලන්ද කෘෂිකර්මාන්තයේ විශේෂයක් ලෙස පවතින්නේ එහි ගොවීන් ගොවිතැන් කරන අන්දමය. ඕලන්ද කෘෂිකර්මය ඉතා සියුම් ක්‍රමවලට ඉටුවේ. ගොවි කටයුතු පිරිසිදුය. විද්‍යානුකූලය. කොටින් කියතොත් ඕලන්ද කෘෂිකර්මය කර්මාන්තයකි.

කෘෂිකාර්මික අධ්‍යාපනය පිළිබඳව ඕලන්තය දක්වන සැලකිල්ල පවා අප විසින් සටහන් කරගත යුතු විශේෂාංගයකි. ඕලන්ද ගොවීන්ගෙන් වැඩි දෙනෙක් ගොවි පාසැල්වල කෘෂිකාර්මික අභ්‍යාසයක් ලැබූ අය වෙති. ලාංකිකයින් මෙන් එවැනි අධ්‍යාපනයක් අපේක්ෂා කරන්නේ රජයේ හෝ වෙන යම් ආයතනයක රක්ෂාවක් බලාපොරොත්තුවද නොවේ. ඕලන්දක්කාරයෝ හුදෙක් ගොවිකම් අධ්‍යාපනයක් පතන්නේ එයින් කෘෂිකාර්මික කටයුතුවලට ලැබෙන අතිරේක ප්‍රයෝජනය උදෙසාය. ගොවිතැන කර්මාන්තයක් ලෙස කිරීමට ඔවුනට හැකිවූයේද මෙම අධ්‍යාපනයේ උපකාරයෙනි.

ඕලන්ද ගොවියා විශේෂ නිපුනත්වයකින් කරන්නේ සත්ව පාලනයයි. මෙයින්ද කිරි හරක් මේච්චලය ඔවුන්ගේ දක්ෂතම ව්‍යාපාරයයි. ඕලන්තයේ සමහර කිරි පට්ටි නිෂ්පාදනයන් ලෝකයේ අනෙක් රටවල්ද පරදවා, විශාල ලෙස ඉතා උසස් තත්වයකින් නිපදවේ. කිරි හරක් මේච්චලය හා අනෙක් සත්ව පාලන වැඩ පමණක් නොව කෘෂ්‍ය බෝග වගාව හා උද්‍යාන විද්‍යාව ගැන අගනා කරුණු රාශියක් ඕලන්ද ගොවියා ගෙන් උගත හැකි නිසා මේ පිළිබඳව ලියවී ඇති ලිපියට පාඨකයාගේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමු.



බණ්ඩප්පුහාමි මහතා ඇල වෙලිවලින් ද ප්‍රයෝජන ගනී.—වැල් එළවළු

# සරු අස්වනු ලබා ගැනීමට ගොවි මහතෙකුගෙන් උපදෙස්

නාත්තන්ඩිය—තබ්බෝව පදිංචි, හැටදැවිරිදි ඩබ්ලිව්. එච්. බණ්ඩප්පුහාමි මහතා වී ගොවිතැන පිළිබඳ 45 වසක පළපුරුද්දක් ඇති කෙනෙකි. එවකට ගම්වල භාවිතය කළ ගොවිතැන් ක්‍රම පමණක් අවුරුදු ගණනාවක්ම අනුගමනය කර අක්කරයකින් වී බුසල් 20 කට වැඩි ප්‍රමාණයක් අස්වනු කරගත නොහැකි වූ බණ්ඩප්පුහාමි මහතා 1928 වර්‍ෂයේ සිට දියුණු ක්‍රම කෙමෙන් පිළිපැදීම ආරම්භ කෙළේය. එම වර්‍ෂයේ සිට ගොම පෝර, එළුපෝර, කොළපෝර ආදිය කුඹුරට යෙදීමෙන් අක්කරයකින් ලැබූ අස්වැන්න ප්‍රමාණය බුසල් 5 න් වැඩි කර ගැනීමට ඔහුට පිළිවන් විය. 1940 වර්‍ෂයේ කුඹුරු සකස් කිරීම වඩා ක්‍රමවත් ලෙස කර, වල් නෙලීම පිළිපැදීමෙන් බුසල් 30 දක්වා අස්වනු වැඩි කර ගත හැකි විය. පසු කාලයක දී ගොයමට රසායනික පෝර යෙදීමටද පුරුදු පුහුණු වූ ඔහුට සිය කුඹුරේ අස්වැන්න තව දුරටත් වැඩිකර ගැනීමට හැකිවිය. රෝග බීජ නැසූ බිත්තර වී පාවිච්චි කිරීම, රසායනික පෝර වර්‍ග කොටස් වශයෙන් යෙදීම, වල් නෙලීමට අතිරේක වශයෙන් වල් පැළෑටි